# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1851/31 - 2014 පෙබරවාරි මස 28 වැනි සිකුරාදා - 2014.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. : 123/48(iii).

**(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනත**

(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19(ඇ) වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලද සහ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,<br>
සෞඛ්‍ය අමාත්‍ය,

2014.02.26 වැනි දින,<br>
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග "2014 අංක 01 දරන ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (ලේඛකාධිකාරී පත්කිරීම) නියෝග" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

2. (මෙහි මින් මතු "වෛද්‍ය සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී තනතුර පුරප්පාඩු වූ විට දිනපතා පුවත්පතක සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළකරනු ලබන දැන්වීමක් මගින් මෙහි 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහිත තැනැත්තන්ගෙන් ඒ සඳහා අයදුම්පත් කැඳවිය යුතු ය.

3. (1) 2 වැනි නියෝගය යටතේ සඳහන් පුවත්පත් දැන්වීමට අනුකූලව අයදුම්පත් ඉදිරිපත් කරන සෑම අයදුම්කරුවෙකුම,

(අ) වෛද්‍යවේදී ප්‍රථම උපාධිය ලබා සිටිය යුතුය. වෛද්‍ය විද්‍යාවට අදාළ කුමන හෝ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා තිබෙන අයදුම්කරුවන් වෙත ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දෙනු ඇත ;

(ආ) රජයේ වෛද්‍ය නිලධාරියෙකු ලෙසින් අවම වශයෙන් වසර විස්සකවත් පළපුරුද්ද ලබා තිබිය යුතුය. මෙකී වසර විස්සක සේවා පළපුරුද්දෙන් අවම වශයෙන් වසර පහක්වත් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලද පළපුරුද්දක් විය යුතු ය; සහ

(ඇ) පත්වීම් දිනට වයස අවුරුදු 45ට නොඅඩු විය යුතුය.

(2) ලේඛකාධිකාරී ධුරයට පත්කරනු ලබන තැනැත්තා මනා චරිතයකින් යුතු සහ නොකළැල් සේවා වාර්තා සතු තැනැත්තෙකු විය යුතුය.

(3) ලේඛකාධිකාරී ධුරයට පත් කරන කුමන හෝ තැනැත්තෙකුට එකී තනතුරේ රාජකාරී සම්බන්ධයෙන් හෝ වෛද්‍ය සභාවේ කටයුතු සම්බන්ධයෙන් හෝ ගැටෙන අයිතිවාසිකම් නොපැවතිය යුතු ය. එමෙන්ම, යම් අධිකරණයක් මගින් අපරාධ වරදක් සම්බන්ධයෙන් වරදකරුවෙකු කර නොතිබිය යුතු අතරම යම් වෘත්තීයමය විෂමාචාරයක් සම්බන්ධයෙන් වෛද්‍ය සභාව මගින් දඬුවමකට යටත් කොට නොතිබිය යුතු ය.

4. (1) වෛද්‍ය සභාවේ සභාපති විසින් මූලාසනය දරනු ලබන සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්‍ෂ ජනරාල්, වෛද්‍ය සභාව විසින් නම් කරනු ලබන වෛද්‍ය සභාවේ සාමාජිකයන් දෙදෙනෙක් (2) සහ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන එක් අයෙකුගෙන්ද, සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කළ යුතු ය.

(2) ලේඛකාධිකාරී වශයෙන් පත් කරනු ලැබීම සඳහා වඩාත්ම සුදුසු අයදුම්කරුවා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වෛද්‍ය සභාව වෙත නිර්දේශ කළ යුතු ය.

5. ලේඛකාධිකාරීවරයාගේ කාර්ය සහ කර්තව්‍ය වනුයේ ඃ

(අ) වෛද්‍ය සභාවේ ලේකම් ලෙසින් කටයුතු කිරීම;

(ආ) වෛද්‍ය සභාවේ කාර්ය කළමනාකරණය කිරීම, නිවේදන නිකුත් කිරීම සහ වෛද්‍ය සභාව වෙනුවෙන් සියලු ලිපි ගනුදෙනු සිදු කිරීම;

(ඇ) වෛද්‍ය සභාව විසින් නව භාණ්ඩාගාරිකවරයෙකු පත් කරන තෙක් වෛද්‍ය සභාවේ භාණ්ඩාගාරික ලෙසින් කටයුතු කිරීම;

(ඈ) වෛද්‍ය ආඥාපනතට අනුව වෛද්‍ය නිලධාරීන්ගේ, දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ සහ ඖෂධවේදීන්ගේ ලේඛන පවත්වාගෙන යාම;

(ඉ) වෛද්‍ය සභාවේ රැස්වීම් කැඳවීම සහ රැස්වීම් වාර්තා සටහන් කිරීම සහ පවත්වාගෙන යාම;

(ඊ) වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ විනය සම්බන්ධයෙන් වන තීරණ ද ඇතුළත්ව පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වෛද්‍ය සභාව විසින් ගන්නා වූ තීරණ ක්‍රියාත්මක කිරීම; සහ

(උ) වෛද්‍ය සභාව විසින් නියම කරන අනෙකුත් සියලුම කාර්ය වේ.

6. ධුර කාලය අවසන්වීමට පෙර ඉල්ලා අස්වීම හෝ ධුරය හැරයාම හේතුකොටගෙන මිස මෙම නියෝග යටතේ පත්කරනු ලබන ලේඛකාධිකාරීවරයා අවුරුදු තුනක කාලයක් සඳහා අදාළ ධුරය දැරිය යුතු අතර ඔහුව දෙවන වාරයක් සඳහා ද නැවත පත්කර ගැනීමට හැකි ය. එසේ වුවද කිසිම පුද්ගලයෙකු ලේඛකාධිකාරීවරයෙකු වශයෙන් අවුරුදු 6 (හය)කට වැඩියෙන් ධුරය නොදැරිය යුතු ය. (වාර දෙකක්)

7. අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා ලබාදෙන අනුමැතියට යටත්ව ලේඛකාධිකාරීවරයාට වැටුප් හෝ අනෙකුත් පාරිශ්‍රමික ගෙවීම වෛද්‍ය සභාව විසින් තීරණය කළ යුතු ය.

8. මෙම නියෝග යටතේ පත් කරනු ලබන ලේඛකාධිකාරීවරයා විසින් සිදු කරන රාජකාරී සම්බන්ධයෙන් වන බරපතල පැහැර හැරීමක් හෝ බරපතල විෂමාචාරයක් හෝ ඔහුගේ අශක්නුතාවයක් මත ඒ සම්බන්ධයෙන් සිදුකරන විධිමත් පරීක්ෂණයකින් අනතුරුව ඔහු ධුරයේ රාජකාරී කටයුතු කිරීම අත්හිටුවීමට හෝ ඔහු ධුරයෙන් ඉවත් කිරීමට හැකි ය.

9. ලේඛකාධිකාරීවරයා

(අ) වයස අවුරුදු හැට සම්පූර්ණ කළ විට හෝ ධුර කාලය අවසන් වීමෙන් ;

(ආ) මියගියහොත් ;

(ඇ) වෛද්‍ය සභාවේ සභාපතිවරයා අමතා යවන ලිපියක් මගින් ඉල්ලා අස්වුවහොත් හෝ ;

(ඈ) වෛද්‍ය සභාව විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත්,

ලේඛකාධිකාරී ධුරය හිස් විය යුතු ය.

10. මෙම නියෝගවල කාර්ය සඳහා,

"වෛද්‍ය සභාව" යන්නෙන්, වෛද්‍ය ආඥාපනතේ (105 වන අධිකාරය) 12 වැනි වගන්තිය යටතේ ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා වෛද්‍ය සභාව අදහස් වේ; සහ

"අමාත්‍යවරයා" යන්නෙන්, සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ.

11. අංක 7727 දරන සහ 1929.08.09 දිනැති *ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ස්ථාවර නියෝගවල 9 වැනි පරිච්ඡේදය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

03-338

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.